රාහුල විද්‍යාලයීය
වර්ණ ප්‍රදානය 2025

1. වර්ණ සහ විශිෂ්ඨ කුසලතා ලබන්නේ 2025 ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව සඳහා පමණි. අදාළ ක්‍රීඩා සහතික වල ඡායා පිටපත් අයදුම්කරු විසින් සත්‍ය පිටපත් බවට සහතික කර එම සියළු සහතික පිළිබඳ තොරතුරු ඇතුළත් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ද සමග 2026.11.18 දිනට පෙර ක්‍රීඩා අංශය වෙත ලබා දිය යුතු ය.
2. ඒ ඒ ක්‍රීඩාවන්ට අදාළව වයස අවුරුදු 17 න් පහළ,18 න් පහළ,19 න් පහළ සහ 20 න් පහළ වයස් සීමා සඳහා කණ්ඩායම් නියෝජනය/ ජයග්‍රහණ වෙනුවෙන් වර්ණ හිමිවේ.
3. වර්ණ ලබා දීම සඳහා පහත ආයතන සංවිධානය කරනු ලබන තරගාවලියකදී විද්‍යාලයීය කණ්ඩායම හෝ විද්‍යාලය නියෝජනය කරමින් සමස්ත ලංකා ප්‍රථම/දෙවන/තෙවන ස්ථාන ලබා තිබිය යුතුය.
    - අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන තරගාවලි
    - පාසල් සංගම් මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා මට්ටමේ තරගාවලි
4. ජාත්‍යන්තර තරග වලට සහභාගී වීමේදී වර්ණ ලබාදීම සඳහා අදාළ ක්‍රීඩකයා අදාළ ක්‍රීඩාවේ අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් සංගමය, ජාතික සංගමය නියෝජනය පමණක් සලකා බලනු ලැබේ.
5. ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමක් හෝ ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමක් නියෝජනය කරමින් ජාත්‍යන්තර තරගාවලි සඳහා සහභාගී වන ක්‍රීඩකයින් සඳහා වර්ණ හිමිවේ.
6. ජාත්‍යන්තර තරගාවලියක් ලෙස පිළිගැනෙන්නේ අදාළ ක්‍රීඩාවේ මව් සංගමය හෝ ප්‍රධාන අනුබද්ධ සංගමයක් විසින් සංවිධානය කරනු ලබන රටවල් 06 ක් හෝ ඊට වඩා වැඩි රටවල් සංඛ්‍යාවකින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් සහභාගී වන අන්තර් ජාතික තරගාවලියන්ය.
7. ජාත්‍යන්තර තරගාවලි ලෙස

    - ඔලිම්පික් තරගාවලි
    - ලෝක තරගාවලි
    - පොදු රාජ්‍ය මණ්ඩලීය තරගාවලි
    - ලෝක කනිෂ්ඨ තරගාවලි
    - ආසියානු යොවුන්/ කනිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ තරගාවලි
    - දකුණු ආසියානු කනිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ තරගාවලි
8. ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමක් ලෙස පිළිගැනෙන්නේ පාසල් කිහිපයකට අයත් ක්‍රීඩකයන්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කණ්ඩායමක් වන අතර, ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමක් ලෙස විද්‍යාලයීය කණ්ඩායම නියෝජනය කළ අවස්ථාවක එය ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමක් නියෝජනයක් ලෙස නොසැලකෙන අතර, එය වර්ණ සඳහා අදාළ නොවේ.

9. ආරාධනා මත ජාත්‍යන්තර තරගාවලියකට සහභාගී වන ජයග්‍රාහී කණ්ඩායම් වලට වර්ණ ප්‍රදානය නොකෙරේ.නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව, ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සංගමයේ අනුමැතිය ඇතිව ශ්‍රී ලාංකික ජාතික ක්‍රීඩා සංගමයක් නියෝජනය කරන ක්‍රීඩකයෙකුට වර්ණ ලබාගැනීම සඳහා හිමිකමක් ඇති නමුත් මෙහිදී එම ක්‍රීඩකයා සහභාගී වන තරගාවලිය එම රටේ අදාළ ක්‍රීඩාවේ මව් සංගමය හෝ ඊට අනුබද්ධ ප්‍රධාන සංගමයක් මගින් සංවිධානය කර තිබිය යුතුය.

   මෙම අවශ්‍යතාව සපුරා නොමැති නම් ක්‍රීඩකයින් ශ්‍රී ලංකා පාසල් සංගමය නියෝජනය කළද වර්ණ සඳහා හිමිකම් නොලැබේ.
10. ශ්‍රී ලංකා පාසල් වර්ණ දිනාගන්නා ක්‍රීඩකයින් සඳහා පාසල් වර්ණ හිමිවේ.
11. අදාළ වර්ෂයේ ජාතික සංගම් විසින් කරන ලද ශ්‍රේණිගත කිරීම් වලදී ඒ ඒ වයස් සීමා වලදී ලංකාවේ මුල් 3 දෙනා අතරට පැමිණීම වර්ණ හිමිකර ගැනීමට සුදුසුකමක් වේ.(ජාතික සංගමයේ ශ්‍රේණිගත කිරීමේ ඡායා පිටපතක් අමුණා තිබිය යුතු අතර එය අදාළ සංගමය විසින් අනුමත කර තිබිය යුතුයි.)
12. කිසියම් ක්‍රීඩකයෙකු විසින් තමන් සහභාගී වූ තරගාවලියකදී ක්‍රීඩා නීති රීති උල්ලංඝය කිරීමේ වරදට දඬුවම් ලබා තිබීම, පාසල් විනය නීති රීති බරපතල ලෙස උල්ලංඝනය කර විනය මණ්ඩලය විසින් දඬුවම් ලබා දී ඇති අවස්ථාවක එම ක්‍රීඩකයා සඳහා වර්ණ ප්‍රදානය නොකෙරේ.මේ සඳහා පාසල් විනය මණ්ඩලය හෝ පරිපාලන මණ්ඩලය මගින් ඒ බව ලිඛිතව වර්ණ තේරීමේ කම්ටුව වෙත දැනුම් දිය යුතුය.
13. වර්ණ ප්‍රදානය අවස්ථාවට පැමිණෙන විට පාසලේ විනය නීති රීති වලට හා වර්ණ ප්‍රදානයේ නීති රීති වලට ගැළපෙන ලෙස පැමිණිය යුතුය. එසේ නොවුණහොත් වර්ණ ප්‍රදානෝත්සවයට සහභාගී වීමේ අවස්ථාව අහිමි වේ.
    - ක්‍රීඩා කිහිපයකින් වර්ණ හිමිකම් තිබෙනම් එම එක් එක් ක්‍රීඩාවේ වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ලබාදිය යුතුවේ.
    - වර්ණ සඳහා අයදුම් කිරීමේදී අදාළ ඉල්ලුම් පත්‍රය ක්‍රීඩා අංශයෙන් ලබාගෙන උපදෙස් පරිදි නිවැරදිව පුරවා අදාළ සියළුම සහතික පත්‍ර වල ඡායා පිටපත් අමුණා ක්‍රීඩා අංශය වෙත ලබා දිය යුතු ය. එසේ ලබාදීමේදී එම ඡායා පිටපත් අදාළ ක්‍රීඩා භාර ගුරුතුමා විසින් මුල් පිටපත පරීක්ෂා කර බලා සත්‍ය පිටපතක් ලෙස තහවුරු කර තිබිය යුතුය.
14. සියළුම වයස් කාණ්ඩ සඳහා විශිෂ්ඨ කුසලතා සහතික හිමිවේ. ඉහත වර්ණ ලබාදීමේදී සලකා බලන ලද නිර්ණායක මේ සඳහා ද අදාළ වේ.
15. ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

පහත සුදුසුකම් මත එක් එක් ක්‍රීඩාව සඳහා වර්ණ හා විශිෂ්ඨ කුසලතා වෙනුවෙන් ඉල්ලුම් කළ හැක.

01. ක්‍රිකට් වර්ණ

- ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කිරීම. (අවුරුදු 20 න්පහළ, 19 න් පහළ,17 න් පහළ, 15 න් ඉහළ)
- ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් තරගාවලියකදී ශූරතාවය හෝ අනුශූරතාවය ලබාගත් කණ්ඩායම් සාමාජිකයෙකු වීම.(අවුරුදු 20 න්පහළ, 19 න් පහළ, 17 න් පහළ, 15 න් ඉහළ)
- අවුරුදු 17 න් පහළ හා 19 න් පහළ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් තරගාවලියකදී,
    1. ශූරතාවය ලබාගත් කණ්ඩායම් සාමාජිකයෙකු වීම.
- ඉහත තරගාවලියකදී අදාළ කාණ්ඩයේ
    2. දක්ෂතම පිතිකරුවා වීම
    3. දක්ෂතම පන්දු යවන්නා වීම
    4. දක්ෂතම පන්දු රකින්නා වීම
    5. තුන් ඉරියව්වේම දක්ෂතම ක්‍රීඩකයා වීම
- දකුණු පළාත් පාසල් ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වය දැරීම. (අවුරුදු 19 න්පහළ, 17 න් පහළ)
- අවුරුදු 19 න් පහළ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් තරගාවලියකදී අවම වශයෙන්
    1. පිතිකරුවෙකු නම් ලකුණු 750 ක් ලබාගැනීම.
    2. පන්දු යවන්නෙකු නම් කඩුලු 65 ක් ලබාගැනීම.
    3. තුන් ඉරියව් ක්‍රීඩකයෙකු නම් ලකුණු 400 ක් සහ කඩුලු 35 ක් ලබා ගැනීම.

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- ජාතික කණ්ඩායම නියෝජනය (අවුරුදු 15 න් පහළ හා 13 න් පහළ)
- දකුණු පළාත් පාසල් ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කිරීම.(ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- පිළිගතහැකි ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් තරගාවලියකදී ශූරතාවය හෝ අනුශූරතාවය ලබාගත් කණ්ඩායම් සාමාජිකයෙකු වීම.
- ඉහත ආකාරයේ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් තරගාවලියකදී
    1. දක්ෂතම පිතිකරු වීම
    2. දක්ෂතම පන්දු යවන්නා වීම
    3. දක්ෂතම පන්දු රකින්නා වීම
    4. තුන් ඉරියව්වේම දක්ෂතම ක්‍රීඩකයා වීම
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

02. පාපන්දු වර්ණ

- සමස්ත ලංකා තරඟයකදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 18 න් පහළ,20 න් පහළ)
- පාසල් පාපන්දු සංගමයෙන් පවත්වනු ලබන A / B කාණ්ඩ යටතේ ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම.

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් පාසල් තරඟවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරඟාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

03. පැසිපන්දු වර්ණ

- සමස්ත ලංකා පාසල් තරඟ වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 14 න් ඉහළ)
- පාසල් පැසිපන්දු සංගමයෙන් පවත්වනු ලබන A කාණ්ඩයේ තරඟ වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම.(අවුරුදු 14 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් පාසල් තරඟවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (A කාණ්ඩය හා B කාණ්ඩය ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරඟාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

04. චෙස් වර්ණ

- සමස්ත ලංකා පාසල් තරඟ වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 14 න් ඉහළ)
- පාසල් චෙස් සංගමයෙන් පවත්වනු ලබන සමස්ත ලංකා A කාණ්ඩයේ තරඟ වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම.(අවුරුදු 14 න් ඉහළ)

කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්

- දකුණු පළාත් පාසල් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

05. මලල ක්‍රීඩා වර්ණ

- ජාතික පාසල් ක්‍රීඩා තරග, සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරග, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පවත්වනු ලබන සමස්ත ලංකා මට්ටමේ මලල ක්‍රීඩා තරග, මලල ක්‍රීඩා සංගමයෙන් පවත්වන ජාතික ක්‍රීඩා තරග
  ඉහත තරග වලට ඉදිරිපත්ව ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම හා වර්ණ දිනාගැනීම. (අවුරුදු 16 න් ඉහළ)

කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්

- දකුණු පළාත් පාසල් මලල ක්‍රීඩා තරගයේදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- පළාත් කුසලතා සහතික ලබා තිබීම.(ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

06. බැඩ්මින්ටන් වර්ණ

- සමස්ත ලංකා පාසල් බැඩ්මින්ටන් තරගාවලියේදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 20න් පහළ, 18 න් පහළ,16න් පහළ වයස් කාණ්ඩ නියෝජනය කරමින්)
- සමස්ත ලංකා පාසල් බැඩ්මින්ටන් සංගමයෙන් පවත්වනු ලබන බැඩ්මින්ටන් තරගාවලියේදී සුපර් A , A කාණ්ඩ වල ශූරතාවය, අනුශූරතාවය ලබා ගැනීම.(අවුරුදු 19න් පහළ, 17 න් පහළ වයස් කාණ්ඩ නියෝජනය කරමින්)

කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්

- දකුණු පළාත් පාසල් බැඩ්මින්ටන් තරගවලදී A,B කාණ්ඩ වල ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

07. පිහිනුම් වර්ණ

- සමස්ත ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන තරග, පාසල් පිහිනුම් සංගමය මගින් සංවිධානය කරනු ලබන තරග හා ජාතික සංගමය මගින් සංවිධානය කරනු ලබන තරග
  ඉහත තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් පාසල් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- දකුණු පළාත් පාසල් කුසලතා සහතික ලබා තිබීම. (වයස අවුරුදු 12න් පහළ)
- ජාතික තරගාවලි වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (අවුරුදු 16 න් පහළ)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

08. වොලිබෝල් වර්ණ

- සමස්ත ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන තරග, පාසල් වොලිබෝල් සංගමය මගින් සංවිධානය කරනු ලබන තරග
  ඉහත තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 14 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් පාසල් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

09. ජිම්නාස්ටික් වර්ණ

- සමස්ත ලංකා පාසල් තරග, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා තරග,
  ඉහත තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)
- පාසල් සංගමය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා A,B කාණ්ඩයේ තරග වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් පාසල් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම.(ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

10. ඉලක්කයට වෙඩි තැබීම වර්ණ

- සමස්ත ලංකා තරග, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා තරග,
  ඉහත තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)
- පාසල් සංගමය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා A,B කාණ්ඩයේ තරග වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් පාසල් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

11. කරාතේ වර්ණ

- සමස්ත ලංකා තරග, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා තරග,
  ඉහත තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)
- පාසල් සංගමය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා A,B කාණ්ඩයේ තරග වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් පාසල් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම. (ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

12. වූෂු වර්ණ

- සමස්ත ලංකා තරග, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා තරග,
  ඉහත තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)
- පාසල් සංගමය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා A,B කාණ්ඩයේ තරග වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම.(ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

13. රග්බි වර්ණ

- සමස්ත ලංකා තරග, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා තරග,
  ඉහත තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)
- පාසල් සංගමය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා A,B කාණ්ඩයේ තරග වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම.(ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

14. ටයිකොන්ඩෝ වර්ණ

- සමස්ත ලංකා තරග, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා තරග,
  ඉහත තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)
- පාසල් සංගමය මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා A,B කාණ්ඩයේ තරග වලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගැනීම. (අවුරුදු 16 න් ඉහළ)

<u>කුසලතා සහතිකයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්</u>

- දකුණු පළාත් තරගවලදී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබාගැනීම.(ඕනෑම වයස් කාණ්ඩයක් නියෝජනය කරමින්)
- ජාතික මට්ටමේ ආධුනික ක්‍රීඩා තරගාවලි වල ජයග්‍රහණ සඳහා (ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය,තෙවන ස්ථානය) විශිෂ්ඨ කුසලතා සහතික පමණක් හිමිවේ.

අත්/කළේ
එච්.කේ.එල්.බී.විරාජිත්
විදුහල්පති
රාහුල විද්‍යාලය
මාතර